දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
Devi Balika Vidyalaya - Colombo

පළමු වාර පරීක්ෂණය - 2012
First Term Test - 2012

බුද්ධ ධර්මය

11 ශ්‍රේණිය

පැය 1 1/2

නම : ...................................................................... විභාග අංකය : ..................

* සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

01) නිවන අවබෝධය පිණිස හේතුවන ආර්ය අෂ්ටාංගික මාර්ග පිළිවෙත් සපුරන මහා සංඝරත්නය
1. අහුනෙය්‍යය වන සේක
2. ඤායපටිපන්න වන සේක
3. පාහුනෙය්‍යය වන සේක
4. සුපටිපන්න වන සේක

02) ත්‍රිලක්‍ෂණය මෙනෙහි කරමින් පංච උපාදානස්කන්ධය දෙස ගැඹුරින් බැලීමේදී ප්‍රඥාව වැඩිදියුණු කරගත හැක. මෙම භාවනාව හැඳින්වීමට නුසුදුසු නාමය සොයන්න.
1. ප්‍රඥා පාරමිතාව
2. විදර්ශනා භාවනාව
3. මෛත්‍රීභාවනාව
4. චිත්ත භාවනාව

03) පව්කම් වලට පමණක් නොව පින්කම් වලටද විපාක මෙලොව දීම ලැබේ. මෙය හඳුන්වන්නේ.
1. දිට්ඨධම්ම වේදනීය කර්ම ලෙස
2. උපපජ්ජවේදනීය කර්මය ලෙස
3. අපරාපරියවේදනීය කර්ම ලෙස
4. අහෝසි කම්ම ලෙස

04) කරණීය මෙත්ත සූත්‍රයේ දැක්වෙන පරිදි මෛත්‍රීය වැඩීම ආරම්භ කරන පුද්ගලයෙකු ඇති කරගත යුතු ගුණාංග අතර 'කටයුතු බහුලනොවීම'
1. අනතිමාන නම් වේ
2. නිවන නම්වේ
3. අප්පකිච්චෝ නම් වේ
4. අප්පගබ්බෝ නම්වේ

05) මිනිස් වර්ගයා අතර පහළ වූ අති ශ්‍රේෂ්ඨ පුරුෂෝත්තමයා බුදුන් වහන්සේය. මෙසේ පැවසුවේ.
1. එච්. ජී. වේල්ස්
2. අබ්දුල් අනාහිලා
3. රාධ ක්‍රිෂ්නන්
4. ජවහල්ලාල් නේරු

06) සමාජයේ ඇති නොයෙක් දුසිරිත් දැක ඒවාට ගොදුරු නොවී සිටීම.
1. සල්ලේඛ පටිපදාවයි
2. මධ්‍යම පටිපදාවයි
3. ත්‍රිශික්‍ෂා පටිපදාවයි
4. අරි අට මගයි

07) අටලෝ දහමට අයත් නොවන්නේ,
1. මෙත්තා - කරුණා
2. ලාභ - අලාභ
3. යස - අයස
4. නින්දා - ප්‍රශංසා

08) පංච නීවරණ ධර්මයන්ට අයත් නොවන්නේ,
1. කාමච්ඡන්ද 2. ව්‍යාපාද
3. ථීන මිද්ද 4. විප්පයෝග

09) කය හා වචනය සංවර කර ගැනීම බුදු දහමෙහි හැඳින්වෙන්නේ,
1. භාවනාව ලෙස 2. සීලය ලෙස
3. විදර්ශනාව ලෙස 4. සමාධිය ලෙස

10) කාලසටහනකට අනුව දිනය සැලසුම් කළ බුදු රජානන් වහන්සේ මහා කරුණා සමාපත්තියට සම වැදී ලෝකය දෙස බලා පිහිට විය යුතු පුද්ගලයින් පිළිබඳ සොයා බැලූහ. මෙම කාර්ය අයත් වන්නේ,
1. පෙර බත් කිසට 2. මැදියම් කිසට
3. පෙරයම් කිසට 4. පැසුළුයම් කිසට

11) තමා ගැන සිතා තමා ගෞරවයට හානි සිදුවන බව සලකා වරදින් වැළකීම අයත්වන අධිපති ධර්මය නම්,
1. ලෝකාධිපතෙය්‍යය 2. ධම්මාධිපතෙය්‍යය
3. අත්තාධිපතෙය්‍යය 4. අන්දපනායික ධර්මය

12) පාරමිතා පිරිමේදී තම අත්පා ආදී ශරීරාංග පවා පරිත්‍යාග කරමින් එකී ගුණධර්ම සම්පූර්ණ කිරීම
1. පාරමී නම් වේ 2. උප පාරමී නම් වේ
3. පරමස්ථ පාරමී නම්වේ 4. පරක්කම ධාතු නම් වේ

13) රාජ්‍ය පාලනයට අදාළ වන 'සප්ත අපරිහානිය' ධර්ම අනුගමනය කළ බුද්ධකාලීන රාජ්‍යය වනුයේ,
1. වජ්ජි රාජ්‍යයයි 2. කෝසල රාජ්‍යයයි
3. මගධ රාජ්‍යයයි 4. කාසි රාජ්‍යයයි

14) සම්බුද්ධ පරිනිර්වාණයෙන් අවුරුදු සියයකට පසුව දෙවන සංගායනාව පැවැත්වූයේ
1. රජගහනුවර 2. විශාලාමහනුවර
3. කොසඹෑ නුවර 4. පැළලුප් නුවර

15) 'අවේච්චප්පසාද යන්නෙන් අදහස් කරනුයේ
1. තෙරුවන් පිළිබඳ කරුණු දැන පැහැදීමයි 2. තෙරුවන් ගුණ දැන ගැනීමයි
3. තෙරුවන් සරණ යාමයි 4. තෙරුවන් පිළිබඳ ඇති පැහැදීමයි

16) සප්ත ආර්ය ධනය නම්
1. පඨවි, ආපෝ, තේජෝ, වායෝ සුඛ දුක්ඛ ජීව
2. ශ්‍රද්ධා, වීර්ය, හිරිඵ ධනප්ප, සති, සමාධි, ප්‍රඥා
3. සති, ධම්ම විචය, වීර්යා , පීති, පස්සන්දි, සමාධි, උපේක්ෂා
4. ශ්‍රද්ධා, ශීල, හිරි, ඔතප්ප, සුත , චාග, ප්‍රඥා

17) මිනිසුන් විකෘති සිත් ඇති, හැසිරීම් ඇති, එක්තරා උමතු පිරිසක් බවට පත්වන්නේ පන්සිල්වල කීවෙනි ශික්ෂා පදය කඩ කිරීමෙන්ද ?
1. පළවන ශික්ෂා පදය 2. දෙවන ශික්ෂාපදය
3. තුන්වන ශික්ෂා පදය 4. පස්වන ශික්ෂාපදය

18) බෝසතාණන් වහන්සේ නෙක්ඛම්ම පාරමිතාව පිරූ අවස්ථාවකට උදාහරණ වශයෙන් දැක්විය හැකි ජාතක කතාවක් වන්නේ,

1. උම්මග්ග ජාතකය
2. වණ්ණුපථ ජාතකය
3. මඛාදේව ජාතකය
4. සීලවීමංස ජාතකය

19) අධ්‍යාත්මික සංවර්ධනය හා සදාචාර සංවර්ධනය සමාජය තුළ ගොඩනැගීමේ අරමුණ ඇතිව වීදාගම මෛත්‍රී මාහිමියන් විසින් ලියූ කාව්‍ය ග්‍රන්ථයකි.

1. සිරිත් මල්දම
2. ලෝවැඩ සගරාව
3. සුභාෂිතය
4. ලෝකෝපකාරය

20) සිතෙහි පවත්නා තැන්පත් භාවය නැතිවීම සඳහා සිතේ නොසන්සුන්කම කලබලවීම හා පසුතැවිල්ලද හේතුවේ. මේ ස්වභාවය පංචනීවරණයන්හි හැඳින්වෙන්නේ,

1. කාමච්ඡන්ද
2. ව්‍යාපාද
3. ථීන මිද්ධ
4. උද්ධච්ච කුක්කුච්ච

21) බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ සිතීමට හා විමසීමට ඇති නිදහස පෙන්වා දී ඇති සූත්‍ර දේශනාව වන්නේ,

1. චූල්ල කම්ම විභංග සූත්‍රය
2. සච්ච විභංග සූත්‍රය
3. කාලාම සූත්‍රය
4. කරණීය මෙත්ත සූත්‍රය

22) ගුණ දහමින් පිරුණු උසස් අයකු ඇසුරු කිරීමට නොමැති නම් හුදකලාව සිටීම අගනා බව ප්‍රකාශ වන ධම්ම පද ගාථාව වන්නේ,

1. උට්ඨානවතෝ සතිමතෝ
2. සාරංච සාරතෝ ඤත්වා
3. චරංචේ නාධි ගච්ඡෙය්‍යය
4. අසාරේ සාර මතිනෝ

23) කිසිවිටෙක තමන්නිසා හෝ අනුන් නිසා හෝ තම අඹුදරුවන් නිසා හෝ අධාර්මිකව ධනය නූපදවිය යුතුය. මෙසේ උගන්වන්නේ,

1. සම්මා කම්මන්තයෙනි
2. සම්මා ආජීවයෙනි
3. සම්මා වායාමයෙනි
4. සම්මා සතියෙනි

24) දස අකුසල් හි ව්‍යාපාදය, අභිධ්‍යාව, මිත්‍යාදෘෂ්ටිය යන අකුසල් සිදුවන ද්වාරය වන්නේ,

1. සිත
2. කය
3. වචනය
4. තිදොරම

25) බුදුරජාණන් වහන්සේ උදෙසා කිඹුල්වත්නුවර ඉදිකළ ආරාමය වන්නේ,

1. ජේතවනාරාමය
2. පූර්වාරාමය
3. නිග්‍රෝධාරාමය
4. වේළුවනාරාමය

(ලකුණු 2 x 25 = 50)



v

## 2 කොටස

(01) පළමු ප්‍රශ්නය සඳහා කෙටි පිළිතුරු සපයන්න.

1. ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි සීලය කොටසකට අයත් මාර්ගාංග දෙකක් නම් කරන්න.

2. බුදු දහමෙහි උගන්වන පුද්ගලචරිත වර්ග දෙකක් ලියන්න.

3. සතර සතිපට්ඨානය නම් කරන්න.

4. සියලු පව් නොකිරීමෙන්ද කුසල් දහම් වැඩීමෙන්ද සිත පිරිසිදු කිරීමෙන් සියලු බුදුරජාණන් වහන්සේලාගේ දහම දැකිය හැක. මෙම අදහස ඇතුලත් ධම්ම පද ගාථාව ලියන්න.

5. පාරමිතා පුරන පුද්ගලයෙකු තුළ තිබිය යුතු ප්‍රධාන ලක්ෂණ දෙකක් ලියන්න.

6. බුදු දහමෙහි දැක්වෙන පරිදි සීලයෙහි ප්‍රභේද දෙක ලියන්න.

7. බුදුරජාණන් වහන්සේගේ චාරිකා වර්ග දෙක ලියා දක්වන්න.

8. බුද්ධකාලීන භාරතයේ සමාපත්ති ලාභීව විසූ තාපසයන් දෙදෙනෙකු නම් කරන්න.

9. බුද්ධ සාසනයේ දැක්වෙන සිවුවනක් පිරිස නම් කරන්න.

10. බුදු දහමට අනුව මරණින් මතු උපත හා පෙර විසූ භවය පිළිබඳ ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන ගැනීමට හැකියාව ලැබෙන ඥාන දෙකක් ඇත. එවා නම් කරන්න.

(02) අ. පුද්ගලයෙකුගේ යසස ගෞරවය කීර්තිය ප්‍රශංසාව උදාකර ගැනීමට හේතුවන කරුනු හත ලියන්න.

ආ. එම කරුණු ඇතුළත් ගාථාව ලියන්න.

(03) අ. ප්‍රධාන භාවනා දෙක නම් කරන්න.

ආ. භාවනා යන වචනයේ අර්ථය ලියන්න.

(04) අ. චතුරාර්ය සත්‍ය ධර්ම අනුපිළිවෙලින් ලියන්න.

ආ. ත්‍රිවිධ තෘෂ්ණාව නම් කරන්න.